**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා සම්මන්ත්‍රණ කාර්යාංශය

SLCB
SRI LANKA
CONVENTION BUREAU

# පුරප්පාඩු

ශ්‍රී ලංකා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා සම්මන්ත්‍රණ කාර්යාංශය (SLCB) යනු රැස්වීම්, දිරිගැන්වීමේ සංචාර, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන (පොදුවේ MICE සංචාරක කර්මාන්තය ලෙස හැඳින්වෙන) සංවර්ධනය කිරීමේ වගකීම පැවරී ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි. පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් අපේක්ෂකයින්ගෙන් SLCB විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සහකාර කළමනාකරු - ප්‍රසම්පාදන තනතුර

**බාහිර අපේක්ෂකයින්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) විසින් පිළිගත් ප්‍රසම්පාදන/සැපයුම් දාම කළමනාකරණය/ව්‍යාපාර පරිපාලනය/වාණිජ්‍යය හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක උපාධියක්.

**සහ**

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු, තනතුරට අදාළ ක්ෂේත්‍රයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයින්**

ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**වයසඃ** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් කේතය සහ සේවක කාණ්ඩයේ මාසික වැටුප් පරිමාණය. (2025.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**MM 1-2 - 2025: Rs (94,170 - 10* 2,480 + 15* 3,450 -170,720)**

(ඉහත වැටුපට අමතරව රජය විසින් අනුමත කරන ලද වෙනත් දීමනා ගෙවනු ලැබේ)

## කනිෂ්ඨ කළමනාකරු - මානව සම්පත්, මණ්ඩල කටයුතු සහ නඩත්තු තනතුර

**බාහිර අපේක්ෂකයින්ඃ**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය/ මානව සම්පත් කළමනාකරණය/ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ උපාධියක්.
- විශිෂ්ට අන්තර් පුද්ගල, ජාලකරණ සහ සන්නිවේදන කුසලතා.
- ඉංග්‍රීසි සහ සිංහල/දෙමළ භාෂා පිළිබඳ මනා දැනුමක් සහ චතුර බවක්.
- රැකියාවට අදාළව සහ අවශ්‍ය පරිදි පොදු පරිගණක මෘදුකාංග පද්ධති සහ පැකේජ භාවිතා කිරීමේ හැකියාව.

**අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත අ හෝ ආ)**

අ. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

ආ. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ,"කළමනාකරණ සහකාර-තාක්ෂණික නොවන" (MA1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයසඃ** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

- වැටුප් කේතය සහ සේවක කාණ්ඩයේ මාසික වැටුප් පරිමාණය. (2025.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**JM 1-2 -2025: Rs (74,010 - 10*1,360+18*2040 -124,330)**

(ඉහත වැටුපට අමතරව රජය විසින් අනුමත කරන ලද වෙනත් දීමනා ගෙවනු ලැබේ)

## රියදුරු තනතුර

**බාහිර අපේක්ෂකයින්**

උපරිම වාර දෙකකදී සම්මාන (02) සාමාර්ථ දෙකක් සහිතව අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් විෂයයන් හයක් (06) සමත් වී තිබීම.

**සහ**

බර වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රය ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) රිය පැදවීමේ පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයින්**

බර වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රය ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) රිය පැදවීමේ පළපුරුද්දක් තිබීම.

**සහ**

ප්‍රාථමික නුපුහුණු (PL1) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයසඃ** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

- වැටුප් කේතය සහ සේවක කාණ්ඩයේ මාසික වැටුප් පරිමාණය. (2025.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**PL 3- 2025: Rs (43,280 - 10*490+10*540+10*590+12*630 -67,040)**

## කාර්යාල කාර්ය සහයක තනතුර

**බාහිර අපේක්ෂකයින්**

එක් වරකදී සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී අ.පො.ස. (සා/පෙළ) විභාගයට පෙනී සිටි පුද්ගලයින්.

**වයස :** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

- වැටුප් කේතය සහ සේවක කාණ්ඩයේ මාසික වැටුප් පරිමාණය. (2025.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**PL 1-2025: Rs (40,500 - 10*450+10*490+7*540+ 15*590 - 62,530)**

**වෙනත්**

සෑම අයදුම්කරුවෙකුම,

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සහ මානසිකව යෝග්‍ය විය යුතුය.
- විශිෂ්ට සදාචාරාත්මක චරිතයකින් හෙබි විය යුතුය.

උනන්දුවක් දක්වන අපේක්ෂකයින්ට තමන් විසින් සකස් කළ අයදුම්පත මෙම දැන්වීම පළ කළ දින සිට දින 14 ක් ඇතුළත සභාපති, ශ්‍රී ලංකා සම්මන්ත්‍රණ කාර්යාංශය, 4 වන මහල, හෝටල් පාසල් ගොඩනැගිල්ල, 78 ගාලු පාර, කොළඹ 3 යන ලිපිනයට තැපෑලෙන් එවිය හැක. කරුණාකර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සලකුණු කරන්න.

රජයේ දෙපාර්තමේන්තු / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අපේක්ෂකයින් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා සම්මන්ත්‍රණ කාර්යාංශය,**
**4 වන මහල, හෝටල් පාසල් ගොඩනැගිල්ල,**
**අංක 78, ගාලු පාර, කොළඹ 03.**

SELACINE